# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

## වීරත්වයෙන් පිරි යොවුන් ඔබට අභිමානවත් වෘත්තියකට ඇරයුම්
## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා කෙඩෙට් නිලධාරියෙකු ලෙස එන්න අප හා එක්වන්න



### මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික අවිවාහක පිරිමි පුරවැසියෙකු විය යුතුය
- 2024 සැප්තැම්බර් මස 30 වන දිනට වයස අවු 18 ට නොඅඩු සහ 26 ට නොවැඩි විය යුතුය
- උස අඩි 5 අඟල් 6 ට නොඅඩු සහ පපුව අවම අඟල් 32 ක් විය යුතුය

### අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්

- අයදුම්කරුවන් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා.පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් (Pearson, Edexel, GCSE, GCE හෝ Cambridge) දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව ගණිතය හා සිංහල / දෙමළ ඇතුළුව විෂයන් හයක් (06) ක් සමත්වීම
- අයදුම්කරුවන් අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් හෝ ඒ හා සමාන සුදුසුකමක් සහිතව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (උ.පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් එක්වරකදී විෂයන් තුනක් (03) සමත්වීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ප්‍රතිශතයක් ලබා තිබීම
- උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ ක්‍රීඩා තරගවලින් ජයග්‍රහණ ලබා තිබීම, අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ

### වැටුප් හා දීමනා, අනෙකුත් ප්‍රතිලාභ

- දීමනාද ඇතුළත්ව එක් එක් නිලයන්ට අදාළ මාසික දළ වැටුප පහත සඳහන් පරිදි වේ

| | | | |
|---|---|---|---|
| කෙඩෙට් නිලධාරීන් | - රු: 51,705.00 | කපිතාන් | - රු: 118,624.30 |
| දෙවන ලුතිනන් | - රු: 101,614.30 | මේජර් | - රු: 124,624.30 |
| ලුතිනන් | - රු: 110,624.30 | | |

- ප්‍රවාහන, නිල ඇඳුම්, වෛද්‍ය ප්‍රතිකාර, ආහාර, නේවාසික, සුභසාධක හා රක්ෂණ පහසුකම් සපයනු ලැබේ
- එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම් සඳහා සහභාගිවීමේ අවස්ථාව සහ උසස් විදේශ පාඨමාලා හැදෑරීමේ අවස්ථාවද හිමි වේ

### බඳවා ගැනීමේ පිළිවෙත

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සාර්ථක, මූලික පුහුණුවෙන් පසු 2 වන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කර බළඇණි වෙත අනුයුක්ත කෙරේ

### අයදුම්පත් යොමු කිරීමේ පිළිවෙත

- මෙම තනතුරු සඳහා රජයේ දෙපාර්තමේන්තු හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ගේ අයදුම් පත්‍රය තම ආයතන ප්‍රධානීගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය
- ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකසන ලද අයදුම් පත්‍රය අදාළ ලියකියවිලිවල ඡායා පිටපත් සමග 2024 මැයි මස 31 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් බඳවා ගැනීමේ නිලධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව, සීතාවක, කොස්ගම යන ලිපිනයට එවිය යුතුය
- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන තනතුර "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ කෙඩෙට් නිලධාරීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය

- මෑතකදී ලබාගන්නා ලද වර්ණ සහතික දෙකක්
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
- ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික
- ආයතන ප්‍රධානීගේ නිර්දේශිත ලිපිය
- ග්‍රාම නිලධාරී සහතිකය
- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අදාළ වෙනත් සහතික


ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

ලිපිනය : බඳවා ගැනීමේ නිලධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව, සීතාවක, කොස්ගම

විමසීම් : 036 2255362 | 011 3188558 වැඩි විස්තර සඳහා "www.army.lk/slavf" වෙබ් අඩවියට පිවිසෙන්න.


සේවය රටට
අභිමානය ඔබට